www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# කොළඹ ප්‍රාදේශීය මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයට ඡන්දය දෙන්න

## Sri Lanka: Vote for the SEP in the provincial election

**සමාජවාදී සමානතා පක්ෂය (ශ්‍රී ලංකාව)**
**2009 අප්‍රේල් 24**

මෙහෙට පැවැත්වීමට නියමිත බස්නාහිර ප්‍රාදේශීය සභා මැතිවරනයේ දී සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලෙස එම පක්ෂය කම්කරුවන්ට තරුන ජනයාට සහ බුද්ධිමතුන්ට කියා සිටී. සමාජවාදී සමානතා පක්ෂය විලානි පීරිස්ගේ නායකත්වයෙන් යුත් අපේක්ෂකයන් 46 දෙනෙක් ගෙන් යුතු ලැයිස්තුවක් මෙම දිස්ත්‍රික්කය සඳහා ඉදිරිපත් කර සිටී. මෙම සියලුම අපේක්ෂකයෝ ජාත්‍යන්තර සමාජවාදී ඉදිරිදර්ශනය මත පදනම්ව, වැඩ කරන ජනතාවගේ අවශ්‍යතා සඳහා ගෙන ගිය, සප්‍රතිපත්තික අරගලයක වාර්තාවක් දරන්නෝය.

මෙම මැතිවරනය පැවැත්වෙන්නේ උතුරුදිග මුලතිවු දිස්ත්‍රික්කයේ යුද මුක්ත කලාපයක සිරවී සිටින්නා වූ දස දහස් ගනන් දෙමල සිවිල් ජනතාවට එරෙහි භයංකර අපරාධවල ආන්ඩුව කරවටක් ගැලී සිටින තතු තුල ය. මෙම සතිය තුල පමනක් ම සිවිල් ජනයා සිය ගනන් මරනු ලැබූහ. බරපතල තුවාල ලැබූවන් ඊටත් වැඩි සංඛ්‍යාවකි. යුද ප්‍රදේශයෙන් එලියට පැන ගත් දහස් ගනන් සරනාගතයෝ හමුදා මුර සහිත සිර කඳවුරු තුලට ගාල් කරනු ලැබ සිටිති. බෙදුම්වාදී එල්ටීටීඊ සංවිධානය අත ඉතුරුව පවත්නා ප්‍රදේශයට "අන්තිම ප්‍රහාරය" එල්ල කිරීමේදී හමුදාව ප්‍රදර්ශනය කර ඇත්තේ මිනිස් ජීවිත කෙරෙහි තුච්ඡ නොතැකීමකි. සසප ආන්ඩුවේ යුද අපරාධ හෙලා දකී. අනාරක්ෂිතව උගුලට හසුවූ දස දහස් ගනන් මිනිසුන් ගැහැනුන් සහ දරුවන් ආරක්ෂා කිරීමට නැගී සිටින ලෙස වැඩ කරන ජනයාට සසප කියා සිටී. සසපට දෙන ඡන්දයක් වනාහී ආන්ඩුවේ වර්ගවාදී යුද්ධයට විරුද්ධ ඡන්දයකි. යුද්ධය සමග ම උත්සන්න කර ඇති ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහ ජීවන කොන්දේසිවලට එරෙහිව ආන්ඩුවේ ප්‍රහාරයට විරුද්ධ ඡන්දයකි; ආන්ඩුවේ ප්‍රචාර පදනම් වී ඇත්තේ ගජබින්න මතය. ආන්ඩුව කරගෙන යන්නේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධය"ක් නොවේ; එහි සැබෑ එල්ලය වනාහී සමස්තයක් වශයෙන් කම්කරු පන්තියට එරෙහිව සිංහල පාලක ප්‍රභූවේ බලය සහ වරප්‍රසාද තහවුරු කර ගැනීම ය. දෙමල ජනයා එල්ටීටීඊයෙන් "විමුක්ත කර ගැනීම" ගැන ආන්ඩුව දෙසාබාන කතන්දර යුද්ධයෙන් පලායන සිවිල් ජනයා කෙරේ ආන්ඩුව දක්වන මර්දනකාරී ක්‍රියා කලාපයෙන් ම හොඳින් හෙලිදරව් වේ.

සසපය සටන් වදින්නේ ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ශ්‍රීලංකා නිදහස් පක්ෂ ආන්ඩුව සහ මෙම ප්‍රතිගාමී යුද්ධයට ආධාර දුන් කොලඹ සමස්ත දේශපාලන සහ මාධ්‍ය සංස්ථාපිතයට එරෙහිව සිංහල දෙමල හා මුස්ලිම් කම්කරුවන් එක්සත් කර ගැනීම උදෙසා ය. සසපය ධනේශ්වර ඊලම් රාජ්‍යයක් පිලිබඳ ඉලක්කය තුලින් දෙමල ජනතාව ලේවැකි උගුලකට ඇද දැමූ එල්ටීටීඊයට කිසිදු සහායක් නොදෙයි. ශ්‍රී ලංකා යුද හමුදාව උතුරින් හා නැගෙනහිරින් ඉවත් කර ගනිව් යන සසපයේ ඉල්ලීම එල්ටීටීඊ සංවිධානයට සහායක් පුදන්නේ ද නැත. සසප අරමුන වන්නේ වර්ග වාදී භේදය පරදවා සමාජවාදී පිලිවෙත් මත පදනම්වූ කම්කරුවන්ගේ සහ ගොවියන්ගේ ආන්ඩුවක් සඳහා කැරෙන විප්ලවවාදී අරගලය මගින් කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම ය. දැන් අන් කවර කලෙකටත් වඩා කම්කරු පන්තිය ධනේශ්වරයේ සියලුම පක්ෂයන්ට එරෙහි තමන්ගේ ම ස්වාධීන පන්ති අවශ්‍යතාවයන් උදෙසා සටන තියුනු කල යුතු ය. එල්ටීටීඊය තලා දැමීම සාමයේ හා සමෘද්ධියේ නව කාලපරිච්ඡේදයකට මුල පුරනු ඇතැයි යන කතාව අසත්‍යයකි.

ආන්ඩුව මෑත යුදමය ජයග්‍රහනයන් මගින් ඉටුකර ගෙන ඇති දෙය නම්, කම්කරු පන්තියේ ජීවන කොන්දේසිවලට එරෙහිව කඩාවැදී පහර දීම සඳහා සූදානම් වෙමින් සිටින කොලඹ පාලක ප්‍රභූවේ අතිශයින්ම දක්ෂිනාංශික කොටස් ශක්තිමත් කිරීමයි. පහුගිය බ්‍රහස්පතින්දා දක්ෂිනාංශික අයිලන්ඩ් පත්‍රයේ කතුවැකිය වැඩ කරන ජනතාවට බලගතුම අනතුරු හැඟවීමකි. රාජපක්ෂ ආන්ඩුවේ අපරාධ "දිවි ගැලවීමේ ශල්‍යකර්මයක්" යයි වර්නනා කල එම පුවත්පත මෙසේ ප්‍රකාශ කලේ ය: "1971 දී සහ 1980 ගනන්වල අග දී දකුනු පලාත් ලේ විලක ගිල්වාලු එම විධික්‍රම සිත් කාවදින ප්‍රතිඵල අත්පත් කර දුන්නේ ය. ශ්‍රීලනිප ආන්ඩුව ප්‍රථම සන්නද්ධ කැරැල්ල සාර්ථකව මැඩ පැවැත්වූ අතර ඉන් දහඅට වසරකට පසු එක්සත් ජාතික පක්ෂ ආන්ඩුව දෙවැන්න මැඩ පැවැත්වී ය."

ජනතා විමුක්ති පෙරමුන මෙහෙය වූ 1971 සහ 1989 කැරලි මැඩ පැවැත්වීම ගැන කෙරෙන කතාව මුලු දිවයින පුරාම වැඩ කරන ජනතාවට එරෙහිව පාලක පන්තිය දැන් සූදානම් කරමින් සිටින්නේ කුමක්ද යන්න පිලිබඳ නපුරු පෙර ඇඟවුමකි. මෙම රාජ්‍ය මර්දන ප්‍රාථමිකව ම යොමු වූයේ ඉවසිය නොහැකි දුප්පත් කමට විරුද්ධව කැරලි ගැසූ සිංහල ගම්බද තරුනයන්ට එරෙහිව ය. එකල්හි කරන ලද "දිවි ගලවාගැනීමේ සැත්කම" 1971 දී අඩු වශයෙන් 17,000ක් ද 1980 ගනන්වල දී අඩුවශයෙන් 60,000ක් ද ජීවිත බිලි ගත්තේ ය. උග්‍රවන්නා වූ ආර්ථික අර්බුදයක් තුල ආන්ඩුව කම්කරු පන්තිය මත පැටවිය යුතු බර නියම

කිරීම සඳහා ධනේශ්වරයේ ලේඛකයෝ වඩවඩාත් මිලිටේරි පද යොදා ගනිති. යුද වියදම් මගින් රට බංකොලොත් කල රාජපක්ෂගේ ආන්ඩුවට දැන් සිදුවී ඇත්තේ ඩොලර් බිලියන 1.9ක දැවැන්ත නයක් සොයා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යාමට ය. මෙහි විපාක දැනට ම කම්කරුවන්ට පැහැදිලි වෙමින් පවතී. ආන්ඩුව රාජ්‍ය අංශයේ වැටුප් වැඩි කිරීම ද අලුතින් රැකියා සැපයීම ද නවතා, නව බදු පනවා, රුපියල අවප්‍රමාන කොට රැකියා කප්පාදුවට ද වැඩ සතිය කෙටි කිරීමට ද පුද්ගලික අංශය උසිගන්නවයි.

මෙවන් පියවරයන් කම්කරු පන්තියේ බලගතු ප්‍රතිවිරෝධය අවුලුවා ලන බව කොලඹ දේශපාලන සංස්ථාපිතය මැනැවින් දැන සිටින බව අයිලන්ඩ් කතුවැකිය පෙන්නුම් කරයි. එල්ටීටීඊයට එරෙහි යුද්ධය යොදාගෙන යුක්ති සහගත කරනු ලබන, පොලිස් රාජ්‍ය පියවරයන්, - ඝෝර හදිසි නීති බලතල, නඩු විභාග යෙන් තොර අත් අඩංගුවේ තබා ගැනීම සහ හමුදා අනුග්‍රහය ලත් ඝාතක කන්ඩායම් - යන මේ සියල්ල යෙදවෙනු ඇත්තේ තම ජීවන තත්වයන් ආරක්ෂා කර ගැනීමට ඉදිරියට එන්නා වූ කම්කරුවන්ට ගොවියන්ට සහ තරුන ජනයාට එරෙහිව ය.

ජනාධිපති රාජපක්ෂ බදාදා කල කථාවක දී තමාට විරුද්ධ හැමදෙනාම එල්ටීටීඊයේ නායක වී. ප්‍රභාකරන්ගේ ගනයට ම අයත් යයි කියා සිටියේ ය. "අද ඉන්නේ එක හතුරෙක් පමනි. දේශපාලන සමාජ හා සංස්කෘතික වර්න මාලාවේ ඇත්තේ දෙපැත්තක් පමනි. මේ පැති දෙක නම් ප්‍රභාකරන්ට සහයෝගය දෙන්නන් සහ ඔහුට විරුද්ධවන්නන් ය." වැඩ වර්ජක කම්කරුවන් ද විරෝධතා දක්වන ගොවියන් ද "ත්‍රස්තවාදී කොටින්ගේ" හවුල්කරුවන් යැයි ආන්ඩුව දැනට ම චෝදනා කර ඇත. රටේ ආර්ථික කලබැගෑනිය උග්‍රවත්වත් ම ආන්ඩුව කරනු ඇත්තේ අයිතිවාසිකම් හා මූලික සමාජ අවශ්‍යතාවයන් ඉල්ලා නැගී සිටින මුලුමහත් වැඩ කරන ජනතාව ද "ආර්ථික ත්‍රස්තවාදීන් යයි නම් කිරීමය." ප්‍රධාන විපක්ෂ දෙක වන එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුන යුද්ධයට සහාය පුදා සිටිති. සිංහල අධිපතිවාදී ජනතා විමුක්ති පෙරමුන තම මාවෝවාදී ගරිල්ලාවාදය අතහැර දමමින් කොලඹ දේශපාලන සංස්ථාපිතයේ කොටසක් බවට පත්වී බොහෝ කල්ය. කාර්මික අරගලය අතහැර දමා කම්කරුවන් යුද ප්‍රයත්නයට කැප විය යුතු යයි ජවිපෙ යලි යලිත් කියා සිටියේ ය. ඉදිරියේ දී එසේ ම ජාතියේ ආර්ථික යහපත සඳහා වැඩ කරන ජනතාව කැප විය යුතු යයි කියා සිටීමේ දී ද ජනතා විමුක්ති පෙරමුන පෙරමුන ගන්නවා ඇත.

නව සමසමාජ පක්ෂය (නසසප) හා එක්සත් සමාජවාදී පක්ෂය (එසප) යන මධ්‍යම පන්තික රැඩිකල් කන්ඩායම් දෙක යුද්ධයට විරුද්ධ බව ප්‍රකාශ කරති. කම්කරු පන්තිය සමාජවාදී ප්‍රතිපත්තිමය පදනමක් මත ස්වාධීනව බලමුලු ගැන්වීම ප්‍රතික්ෂේප කරන මෙම දෙපක්ෂය, ඒ වෙනුවට ධනේශ්වරයේ එක් හෝ තවත් කන්ඩායමකට කම්කරු පන්තිය දේශපාලනිකව යටත් කර තැබීමේ උත්සාහයක නිමග්නව සිටිති. එල්ටීටීඊ මෙන්ම නසසප හා එසප යන කන්ඩායම් දෙකම, රාජපක්ෂගේ යුද්ධයට පිටුබලය දී ඇති ප්‍රමුඛ අධිරාජ්‍යවාදී බලවතුන් මැදිහත්වී සටන් විරාමයක් අටවාදෙන ලෙස ඉල්ලා නිරර්ථක ආයාචනා නිකුත් කරමින් සිටිති.

"අඩු නපුර"ලෙස දක්ෂිනාංශික එජාපයට සහාය දක්වන මෙම දෙපක්ෂය කියා සිටින්නේ මහා ව්‍යාපාරිකයේ පක්ෂය වූ එය රාජපක්ෂ ආන්ඩුවේ නොපනත්කම් වලට එරෙහිවනු ඇති බවකි. 1983 දී දෙමල විරෝධී යුද්ධය ආරම්භ කිරීම මගින් පමනක් නොව, 1980 ගනන් අවසන් භාගයේ ගම්බද සිංහල තරුනයන් ඝාතනය කිරීම මගින් ද අමු අමුවේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පාගා දැමූ එජාපය සමඟ කල්ලි ගසා ඇති නසසප හා එසප, කම්කරු පන්තියේ මොනම ස්වාධීන ව්‍යාපාරයක් ව්‍යාකූල කොට වලක්වා ලීමට වැර දරති. ඔවුන් එමගින් සිදු කරන්නේ ප්‍රභාරයන් තවතවත් උග්‍ර කිරීම සඳහා රාජක්ෂ ආන්ඩුව දිරිමත් කිරීමයි.

ධනේශ්වරයේ හෝ ඔවුන්ගේ රැඩිකල් ක්ෂමාලාපකයන්ගේ කුමන පක්ෂයක් කෙරෙහි හෝ විශ්වාසය නොතබන ලෙස සසප කම්කරු පන්තියෙන් ඉල්ලා සිටී. කම්කරු පන්තිය තමන්ගේ ම ස්වාධීන ශක්තිය මත විශ්වාසය තබමින් ලාභ ගරන ධනපති පද්ධතියේ ම්ලේච්ඡත්වයටත්, එහි දේශපාලන නියෝජිතයන්ගේ ප්‍රතිගාමී පිලිවෙත් වලටත් එරෙහිව සමාජවාදී විකල්පයක් සඳහා සටන් වැදිය යුතු ය.

අපගේ ක්‍රියාමාර්ගයේ මුරගල වන්නේ ජාත්‍යන්තරවාදයයි. වැඩ කරන ජනතාව සිංහල අධිපතිවාදය මෙන්ම දෙමල බෙදුම්වාදය ද ඇතුලු ජාතිවාදයේ හා සකල වර්ගවාදයේ රූපාකාරයන් ප්‍රතික්ෂේප කල යුතු අතර තමන්ගේ පොදු පන්ති අවශ්‍යතාවන් ආරක්ෂාකර ගැනීම සඳහා එක්සත් විය යුතුය. ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය, සාක්ෂාත් කල හැක්කේ දකුනු ආසියාවේ එක්සත් සමාජවාදී සාමූහික රාජ්‍යයක් හා ලෝක සමාජවාදය සඳහා මහා දේශපාලන අරගලයකින් ම පමනි.

මෙම මැතිවරනයේදී සමාජවාදී ජාත්‍යන්තරවාදයේ මූලධර්ම වෙනුවෙන් සටන් වදින එකම පක්ෂය සමාජවාදී සමානතා පක්ෂය යි. 1968 දී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය (විකොස) ලෙසින් අරඹන ලද අපගේ පක්ෂය, 1964 දී සිරිමා බන්ඩාරනායකගේ ධනපති සභාග ආන්ඩුවට ඇතුලු වූ ලංකා සමසමාජ පක්ෂය විසින් පාවා දෙනුලැබූ අරගලය, එනම් ශ්‍රී ලංකාව තුල ට්‍රොට්ස්කිවාදය සඳහා අරගලය අඛන්ඩ ව ඉදිරියට ගෙන යාමේ යෙදී සිටියි.

අපගේ ප්‍රතිපත්ති වලට සහාය දෙන සියල්ලන්ගෙන්ම අප ඉල්ලා සිටින්නේ පක්ෂයේ අපේක්ෂකයන්ට ඡන්දය දෙන ලෙසත්, එහි ඉතිහාසය හා ක්‍රියාමාර්ගය හදාරන ලෙසත්, හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සසපයට බැඳී, කම්කරු පන්තියේ පෘථුල විප්ලවකාරී පක්ෂය ලෙස එය ගොඩනගන ලෙසත් ය.

© www.wsws.org